| | | | | | | |
|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.05 පැය 2300 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 657/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>

**01. නීති විරෝධී ලෙස මෙරටට ගෙන එන ලද එනසහල් සමග සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - ගුවන්තොටුපල පොලිස් ස්ථානය.**

2025.04.05 වන දින අළුයම් කාලයේ ගුවන්තොටුපල පොලිස් වසමේ කටුනායක බණ්ඩාරනායක ගුවන්තොටුපල පැමිණීමේ පයර්න්තයේදී ගුවන්තොටුපල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **තීරු බදු නොගෙවා මෙරටට ගෙන්වන ලද විදේශීය එනසහල් කිලෝ 117 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 41 සහ 49 වයස්වල පසුවන කොළඹ 08 සහ කොළඹ 13 ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ගුවන්තොටුපල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වැලිකන්ද පොලිස් ස්ථානය.**

2025.04.05 වන දින දහවල් කාලයේ වැලිකන්ද පොලිස් වසමේ නවසේනපුර ප්‍රදේශයේදී වැලිකන්ද පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 41 ක් වන නවසේනපුර, වැලිකන්ද ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වැලිකන්ද පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**03. මාරක රිය අනතුරක් - සීගිරිය පොලිස් වසම.**

2025.04.05 වන දින දහවල් කාලයේ සීගිරිය පොලිස් වසමේ දඹුල්ල හබරණ මාගර්යේ අවුඩංගාව ප්‍රදේශයේදී ඉනාමළුව දෙස සිට හබරණ දෙසට කොන්ක්‍රීට් කණුවක් රැගෙන ධාවනය වූ ලොරි රථයේ පිටුපස තට්ටුවේ ගමන් කළ පුද්ගලයෙකු ලොරි රථයේ තට්ටුවේ වම් පස දොර විවෘත වීම හේතුවෙන් පුද්ගලයා බිමට ඇද වැටී එම රථයේ වම්පස පිටුපස රෝදයට යට වී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පුද්ගලයා හබරණ රෝහල වෙත ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 45 ක් වූ ඉනාමළුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය හබරණ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ ලොරි රථය සහ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර සීගිරිය පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**